**විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය - 2017**

-----------------------------------------------------

විදුලි සැපයුම් ස්ථායීතා ප්‍රවර්ධන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක 3409-එස්ආර්අයි දරන ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.05 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ලංකා විදුලිබල මණ්ඩලය හා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. විදුලි බලය සැපයීමේ හා බෙදාහැරීම් පද්ධතිවල කාර්යක්ෂමතාවය හා විශ්වාසනීයබව වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 23,069 කට සමාන එජඩො මිලියන 160.20 ක් වන අතර, ඉන් රු.මිලියන 16,560 කට සමාන එජඩො මිලියන 115 ක් සැපයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වගකීම සහිතව ආසියානු සංවර්ධන බැංකුව විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජුනි 29 දින ආරම්භ කරන ලද අතර, 2021 සැප්තැම්බර් 30 දින වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිතබව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරික්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදි ලෙස හඳුනා ගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර තිබුණේ ද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

---

**2.1 මතය**

---

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ සිවිල් ඉදිකිරීම් වැඩ ආරම්භ කර හෝ ඒ සඳහා වියදම් දරා හෝ නොතිබුණි. ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 856.97 ක පිරිවැයකට ප්‍රසම්පාදනය කර ලංකා විදුලිබල මණ්ඩලයට මාරු කරන ලද ඒරියල් බන්ඩල් කන්ඩක්ටර්, මීඩියම් වෝල්ටේජ් ඉන්සියුලේටර්ස් සඳහා උපාංග, කිලෝ වොට් 36 රැකුන් සඳහා ටෙන්ෂන් සෙට්, කන්ඩක්ටර්ස් හා කේබල්ස් වැනි වත්කම් ඉන්වෙන්ට්‍රි යටතේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 112 ක මුදලක් ව්‍යාපෘති නියාමන වියදම් ලෙස වැයකර කෙරීගෙන යන සිවිල් ඉදිකිරීම් වැඩ යටතේ දක්වා තිබුණි.

### 2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන චක්‍රලේඛයේ 09 ඡේදයේ අවශ්‍ය පරිදි, ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීම සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | | උපයෝජනය කළ අරමුදල් 2017 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 115.00 | 16,560.00 | 22.17 | 3,321 | 2.28 | 344.62 |
| ලංවිම | 45.20 | 6,508.80 | 7.20 | 1,077 | 0.74 | 112.02 |
| එකතුව | 160.20 | 23,068.80 | 29.37 | 4,398 | 3.02 | 456.64 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කාර්යයන් ඉටු කිරීමේ දුර්වල කාර්යසාධනය හේතුවෙන් 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් කරන ලද රු.මිලියන 4,399 ක් වූ මුළු වෙන්කිරීමෙන්, සියයට 10.30 ක් නියෝජනය වන රු.මිලියන 456.64 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. තවද, මුළු වෙන් කිරීමෙන් සියයට 14.8 ක් නියෝජනය වන එජඩො මිලියන 24.30 ක මුදලක් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය සැලැස්මෙහි

වෙන්කර තිබුණු අතර ඉන් සියයට 1.84 ක් නියෝජනය වන එජඩො මිලියන 3.02 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය කර තිබුණි.

(ආ) ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, 2016 ජුනි 30 වන විට ණය ගිවිසුම අත්සන් කිරීමට නියමිතව තිබූ අතර 2016 සැප්තැම්බර් 30 වන විට ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ණය ගිවිසුම 2016 දෙසැම්බර් 19 දින අත්සන් කර තිබූ අතර එය 2017 ජුනි 29 දින බලපැවැත්වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාදයන් සහිතව ආරම්භ කර තිබූ අතර අරමුදල් උපයෝජනයද ප්‍රමාද වී තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ කාර්යයන් ප්‍රධාන සංරචක 04 ක් යටතේ එනම් උතුරු පළාතේ නයිනතිවු, අනලතිවු හා ඩෙල්ෆ්ට් යන හුදකලා දූපත් හි සුළං, සූර්ය කෝෂ, කාර්යක්ෂම ඩීසල් ජෙනරේටර් හා බැටරි යනාදී විවිධ වර්ගයේ විදුලිබල ප්‍රභවයන් මඟින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපිත කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලයේ විශ්වාසවන්ත බව වැඩිදියුණු කිරීම, ග්‍රාමීය විදුලිබල ජාලයන් ව්‍යාප්ත කිරීම හා පන්නිපිටිය හා බියගම පවත්නා ග්‍රිඩ් උප පොළවල්වල බෙදාහැරීම් කාර්යසාධනය වැඩි දියුණු කිරීම, නියාමනය හා වැඩිදියුණු කිරීම් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලදී. කෙසේ වුවද, සැලසුම් කරන ලද කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කිරීම සඳහා වගකීම් ස්ථාපිත කර මූල්‍ය හා භෞතික ඉලක්කයන් මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කිලෝවොට් 33 “Lynx double circuit line” කිලෝමීටර් 270.50 ක් සඳහා මිනුම් කටයුතු නිම කරන ලද බව ව්‍යාපෘති ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබුණද, ඒ පිළිබඳ මිනුම් වාර්තා 2017 දෙසැම්බර් 31 වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එම ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමට 2018 ජුලි 31 වන විටත් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, ගැන්ට්‍රි ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට නිමකර නොතිබූ අතර, කුළුණු රැහැන් එළීම සඳහා සිවිල් ගුවන් සේවා අධිකාරිය, වන සංරක්ෂණ හා වනජීවී දෙපාර්තමේන්තු ආදියෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ඇ) ග්‍රාමීය විදුලිබල ජාලය සඳහා කොන්ත්‍රාත් පැකේජ 02 කින් රු.මිලියන 591.84 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කිරීමට සැලසුම් කර තිබූ කොන්ත්‍රාත් පැකේජයක් පිරිවිතරයන්හි පසුව කරන ලද වෙනස්කම් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 වන විටත් ප්‍රදානය කර නොතිබුණි. තවද, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මට අනුව, කොන්ත්‍රාත් පැකේජ 03 ක් යටතේ රු.මිලියන 1729.44 ක ඇස්තමේන්තුගත පිරිවැයකට ප්‍රදානය කිරීමට නියමිත වූ ප්‍රසම්පාදන කොන්ත්‍රාත්තු, ණය නියෝජිතායතනයේ එකඟතාවය ලැබීමේ ප්‍රමාදයන් හා ප්‍රසම්පාදන කමිටුවේ උපදෙස්වල ප්‍රමාදයන් හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි.

(ඈ) ඉඩම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා අදාළ පළාත් පාලන ආයතනවල අනුමැතීන් ලැබීමේ ප්‍රමාදයන් හේතුවෙන් උතුරු පළාතේ අනලතිවු, ඩෙල්ෆ්ට් හා නයිනතිවු හි දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ඉදිකිරීම පිළිබඳ කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 1,865.36 ක ඇස්තමේන්තුගත පිරිවැයකට වෙරගැන්වූ කොන්ක්‍රීට් හා පෙරදි කණු, මීටර් වැසුම්, ගැලවනයිස් වානේ කම්බි, ඒරියල් බන්ඩ්ල් කන්ඩක්ටර් සහ උපාංග ද්‍රව්‍ය සැපයීම හා බෙදාහැරීම සඳහා 2016 දෙසැම්බර් 26 දින කොන්ත්‍රාත්තු ප්‍රදානය කර රු.මිලියන 104.53 ක අත්තිකාරමක් ගෙවා තිබුණද, ඉහත සඳහන් ද්‍රව්‍ය 2017 දෙසැම්බර් 31 දින වන විටත් සපයා නොතිබුණු බව විගණනයේදී අනාවරණය විය. කෙසේ වුවද, ද්‍රව්‍ය සැපයීම් පිළිබඳව මන්දගාමී ප්‍රගතිය පිළිබඳ හේතු පැහැදිලි කර නොතිබුණි.

(ආ) 2016 ජනවාරි මාසයේදී ප්‍රසිද්ධ කරන ලද ණය නියෝජිතායතනයේ වාර්තාවට අනුව, මහනුවර නගරයට විශ්වාසනීය විදුලිබලය සැපයීම පිළිබඳ වැඩිදියුණු කිරීම් සඳහා අවශ්‍යතාවය අවධාරණය කරන ලද අතර ව්‍යාපෘතියේ සංරචක 4 යටතේ එජඩො මිලියන 21.60 ක වෙන්කිරීමක් සිදුකර තිබුණි. කෙසේ වුවද, එම යෝජනාව ක්‍රියාත්මක කර නොතිබු අතර ඉහත සඳහන් එජඩො මිලියන 20.43 ක වෙන්කිරීම පන්නිපිටිය හා බියගම ග්‍රිඩ් උපපොළවල් වැඩිදියුණු කිරීම සඳහා මාරු කරන ලදී. ඒ සඳහා හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි. ඊට අමතරව, ග්‍රිඩ් උපපොළවල් සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 2018 ජුනි 30 වන විටත් ප්‍රදානය කර නොතිබුණි.

## 3.4 මූල්‍ය පාලන ගැටලු

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තියේ විධිවිධානවලට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් ව්‍යාපෘතිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 3.76 ක් උපයන විට ගෙවීම් බදු ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 15 දිනැති අංක ඩීඑම්ඒ/ඩී/2015 දරන චක්‍රලේඛය අනුව එජඩො මිලියන 10 ක මුළු ඇස්තමේන්තුගත පිරිවැය ඉක්මවන ප්‍රදාන අරමුදල් සැපයෙන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතුය. කෙසේ වුවද, ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරිම පිළිබඳ විධිමත් නියාමන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා හැකිවන පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගෙන නොතිබුණි.